## ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය - 2016

-------------------------------------------------------

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන් ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) සමාලෝචිත වර්ෂය තුළදී අත්පත්කරගත් ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.1,647,552 ක් වුවද වර්ෂය තුළ මුදලින් ගෙවූ ප්‍රමාණය රු.1,528,552 ක් විය. කෙසේවුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී අත්පත්කරගත් වත්කම්වල මුළු වටිනාකම මුදල් ගලායාමක් ලෙස සලකා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගලපා තිබූ ඉකුත් වර්ෂ ගැලපීම් සහ ආරම්භක ශේෂ සඳහා කරන ලද ගැලපීම රු.1,012,967 ක් මෙහෙයුම් ලාභයට බලපෑමක් සිදුකර නොතිබියදී මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී මෙහෙයුම් ලාභයට ගලපා තිබුණි. මෙයට අතිරේකව ගෙවියයුතු විශ්‍රාම පාරිතෝෂික ජංගම වගකීම් වැඩිවීම් ලෙස ගලපා තිබියදීත් මෙහෙයුම් ලාභයෙන් අඩුකර තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.18,316,900 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය හා වෙනත් ආයතන විසින් ලබාදුන් ප්‍රදාන වල එකතුව රු.42,812,944 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ප්‍රදානවලින් මිලදීගත් ජංගම නොවන වත්කම්වල ශුද්ධ වටිනාකම රු.16,146,691 ක් විය. එසේ වුවද ප්‍රදානයන් ගිණුම් තැබීම සම්බන්ධයෙන් ආයතනය විසින් ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම තුළින් ජනිත වු රු.4,800,000 ක අතිරික්තය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ වෙනම හෙළිදරව් කළයුතු නමුත් එය සමුච්චිත අරමුදලට එකතු කර දක්වා තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

**------------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් පන්ති තුනකට අදාල ක්ෂය වෙන්කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද උපලේඛන සමග සැසඳීමේදී රු. 65,424 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**------------------------------------------------------------------------**

විගණනයේදී නිරීක්ෂණය වු නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවු අවස්ථා පහත දැක්වේ.

| **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලිය | |
| (i) 7(3) වගන්තිය | දර්ශනපති/දර්ශනශූරී පාඨමාලා සම්බන්ධ කටයුතු, උසස් උපාධි කමිටුවක් මගින් සිදුවිය යුතු නමුත් මෙම පාඨමාලාවලට අදාළ කාර්යයන් ශාස්ත්‍රීය කමිටුව හරහා සිදුකර තිබුණි. |
| (ii) 12(1)(ඇ) වගන්තිය | ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයෙකු ලෙස පනත යටතේ නිලබලයෙන් පත් කරනු ලබන විශ්වවිද්‍යාලවල එක් එක් පුස්තකාල හා විඥාපන විද්‍යා අංශයේ ප්‍රධානියා 2016 වර්ෂය තුළදී කිසිදු රැස්වීමකට සහභාගී වී නොතිබුණි. |
| (iii) 12(1)(ඉ) වගන්තිය | ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් වූ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සංගමයේ නියෝජිතයා 2016 වර්ෂයේ පැවති රැස්වීම් වාර 09 න් 03 කට පමණක් සහභාගී වී තිබුණි. |
| (iv) 12(1)(ඊ) වගන්තිය | ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයන් ලෙස අන්තර් විශ්වවිද්‍යාලයීය පුස්තකාලයාධිපති කමිටුවේ සාමාජිකයන් අතුරින් ඔවුන් විසින් නම්කරනු ලැබූ පුස්තකාලයාධිපතීන් දෙදෙනෙකු පත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුව සඳහා පමණක් පුස්තකාලයාධිපතීන් දෙදෙනෙකු පත්කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,489,462 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.14,850 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,474,612 ක වර්ධනයක් ඇති වී තිබුණි. වියදම රු.6,919,348 කින් වැඩිවීමට සාපේක්ෂව ආදායම රු.10,393,960 කින් වැඩිවීම නිසා ඉහත පරිදි මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල ඇගයීමේදී 2012 වර්ෂයේ රු. 1,796,279 ක් වූ ආයතනයේ ඌනතාවය 2015 හා 2016 වර්ෂවලදී මූල්‍ය අතිරික්තයක් බවට පත්ව තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු. 10,448,949 ක් වූ ආයතනයේ දායකත්වය 2016 වර්ෂයේ රු. 25,327,683 ක් දක්වා වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය 2 (GEP–2) (1994 - 2002) යටතේ පාසල් පුස්තකාල සංවර්ධනය සඳහා බඳවාගත් පුස්තකාලයාධිපතීන් හා එම පාසල්වල ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීමට කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත කර ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය 1999 අප්‍රේල් 20 දින පිහිටුවන ලදී.

ආයතනය මගින් සමාලෝචිත වර්ෂය තුළදී පාඨමාලා පැවැත්වීම සම්බන්ධ කාර්යසාධනය පහත පරිදි විය.

(අ) ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳව ශාස්ත්‍රපති (MTL) හා ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGTL) පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(i) ගුරු පුස්තකාලයාධිපතිවරුන් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ ශාස්ත්‍රපති (MTL) හා ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGTL) යන සුදුසුකම් ඇතුළත් කිරීමට 2009 අගෝස්තු 19 දිනැති අංක 09/1488/316/055 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාකල යුතු බව දක්වමින් අනුමැතිය ලබා දී තිබූ නමුත් මෙම සුදුසුකම් ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කර නොතිබුණි.

(ii) ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGTL) පාඨමාලාවේ 2012, 2013, 2015 හා 2016 යන අධ්‍යයන වර්ෂ සඳහා සිසුන් ලියාපදිංචි වී නොතිබුණු අතර 2010 හා 2014 වර්ෂ සඳහා ලියාපදිංචි වූ මුළු සිසුන් ගණන 20 ක් විය. එයින් සිසුන් 09 දෙනෙකු පාඨමාලාව සාර්ථකව නිමකර තිබූ අතර ඉතිරි 11 දෙනා පාඨමාලාව හැර ගොස් තිබුණි.

(iii) ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MTL) සඳහා 2013, 2015 සහ 2016 වර්ෂ සඳහා සිසුන් ලියාපදිංචි වී නොතිබුණි. 2012 හා 2014 වර්ෂ සඳහා සිසුන් 26 දෙනෙකු ලියාපදිංචි වී තිබූ අතර ඉන් සිසුන් 13 දෙනෙකු පාඨමාලාව සාර්ථකව නිමකර තිබූ අතර 13 දෙනෙකු පාඨමාලාව හැර ගොස් තිබුණි.

(iv) ඉහත (i) පරිදි කටයුතු කර නොතිබීම පාඨමාලා සඳහා ශිෂ්‍ය ඉල්ලුම අඩුවීමට හේතු වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) 2007 වර්ෂයේ ආරම්භ කරන ලද පුස්තකාල හා තොරතුරු විද්‍යා දර්ශනපති/ දර්ශනශූරී උපාධි පාඨමාලාව සඳහා අඛණ්ඩව සෑම අධ්‍යයන වර්ෂයක් සඳහාම අන්තර්ජාලය, පුවත්පත් හා ගැසට් මගින් තොරතුරු ප්‍රසිද්ධ කර සිසුන් ඇතුළත් කර ගැනීමට කටයුතු කර තිබුණද 2007 – 2010 සිට 2016 – 2019 දක්වා වූ අධ්‍යයන වර්ෂ 10 න් අධ්‍යයන වර්ෂ 6 ක් වෙනුවෙන් පාඨමාලාව සඳහා ශිෂ්‍ය ඉල්ලීම් ලැබී නොතිබුණු අතර අනෙක් අධ්‍යයන වර්ෂ සඳහා සිසුන් 19 ක් බඳවාගෙන තිබුණි.

(i) 2007/2010 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි සිසුන් 07 දෙනාගෙන් එක් සිසුවකු 2017 වර්ෂයේදී දර්ශනපති උපාධියද, තවත් සිසුවකු 2016 වර්ෂයේදී දර්ශණශූරී උපාධියද සාර්ථකව සම්පූර්ණ කරන ලද අතර ඉතිරි සිසුන් පාඨමාලාව හැරගොස් තිබුණි.

(ii) 2011/2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ගෙන් නියමිත වර්ෂ 3 ක අධ්‍යයන කාලය ඉක්මවා තිබූ අතර එම සිසුන් පාඨමාලා කාලය දීර්ඝ කරවාගෙන තිබුණි.

(ඇ) පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති (MLS – FT) උපාධි පාඨමාලාව වසර 02 ක පාඨමාලාවක් වූ අතර 2013-2015 හා 2014-2016 අධ්‍යයන වර්ෂ 02 ක සඳහා ලියාපදිංචි සිසුන් ගණන 11 ක්වූ අතර සිසුන් 05 දෙනෙකු පාඨමාලාව නිමකර තිබුණි. කෙසේ වුවද සිසුන් දෙදෙනෙකු පාඨමාලාව හැරගොස් තිබූ අතර සිසුන් 04 දෙනෙකු 2016 දෙසැම්බර් 31 දිනට පාඨමාලාවේ රැඳී සිටින බව නිරීක්ෂණය විය.

(ඉ) මාස 18 ක පාඨමාලාවක් වූ තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (PGDIM) සඳහා 2013-2014 හා 2014-2015 අධ්‍යයන වර්ෂ 02 සඳහා සිසුන් 27 දෙනෙකු ලියාපදිංචි වී සිසුන් 07 දෙනෙකු පමණක් පාඨමාලාව අවසන් කර තිබූ අතර සිසුන් 10 දෙනෙකු පාඨමාලා කාලය දීර්ඝ කර තිබුණි. තවත් සිසුන් 10 දෙනෙකු පාඨමාලාව හැරගොස් තිබුණි. 2015-2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 11 දෙනෙකු ලියාපදිංචි වී තිබුණු අතර 2016-2017 අධ්‍යයන වර්ෂය සඳහා කිසිදු සිසුවෙකු ලියාපදිංචි වී නොතිබුණි.

## 4.2 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව මිලදී ගැනීම් එම වර්ෂය තුළදීම සිදු නොකිරීම නිසා වැය නොකල රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ, 2016 ජනවාරි 01 දිනට රු.2,362,641 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා රු.4,200,000 ක ප්‍රදාන ලැබී තිබුණු අතර එයින් රු.762,910 ක් හා රු.1,301,006 ක් පිළිවෙලින් පුනරුත්ථාපන ප්‍රදාන හා මානව ප්‍රාග්ධන සංවර්ධන ප්‍රදාන ගිණුම්වලට මාරුකර තිබුණි. මිලදී ගැනීම් සඳහා වර්ෂය තුළ රු.1,528,552 ක් වැය කර තිබුණු අතර ඒ අනුව 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.2,970,173 ක් විය.

(ආ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 11(2)(ජ) වගන්තිය ප්‍රකාරව ආයතනයේ කටයුතු සඳහා වහාම අවශ්‍ය නොවූ මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට කටයුතු කලයුතු වුවද ඊටපටහැනි ලෙස 2016 දෙසැම්බර් 31 දිනට ආයතනය සතු ජංගම ගිණුම්වල ශේෂය රු.12,366,248 ක් හා සෑම මාසයක් අවසානයේදීම සාමාන්‍ය බැංකු ජංගම ගිණුම් ශේෂය රු.9,664,521 ක් ලෙස පවත්වාගෙන තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | පරිගණක හා උපාංගවල පිරිවැය හඳුනාගතහැකි පරිදි ලේඛන පවත්වා නොගැනීම. |
| (ආ) | මෙහෙයුම් පාලනය | පාඨමාලා සඳහා ශිෂ්‍ය ඉල්ලුම වැඩිකර ගැනීමට කටයුතු නොකිරීම. |